**පුත්තලම නගර සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 20 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනයකළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පුත්තලම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**----------------------**

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නගර සභාව සතු රු.846,698 ක් වූ වෙළඳසැලක වටිනාකම පමණක් ගිණුම්ගත කර තිබුණු අතර, අනෙකුත් ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් සහ එකතුව රු.27,498,520 ක් වටිනා මෝටර් රථ තුනක සහ ට්‍රැක්ටර් 03 ක වටිනාකම් තක්සේරු කර ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) ලැබිය යුතු රු.836,318 ක වැටුප් ප්‍රතිපූර්ණ ණයගැතියන් යටතේ ගිණුම් ගතකර නොතිබූ අතර, පිළිසරු ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබිය යුතු රු.3,831,190 ක් ණයගැති ගිණුමේ දෙවරක් ගිණුම් ගතව තිබුණි.

(ඇ) කඩකුලී ආදායම් රු.1,632 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබූ අතර, රු.166,350 ක් වටිනා කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 675 ක් අතැති තොග යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
**------------------------**

ගිණුම් විෂයයන් 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු.25,573,831ක් වුවද, උපයෝගී ලේඛන අනුව එම ශේෂය රු. 24,419,556 ක් වුයෙන්, රු.1,154,275 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.155,959,333 ක් වූ අතර, එදිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.182,762,694 ක් විය. එයින් වර්ෂ එකකට වැඩි ගෙවිය යුතු හා ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව පිළිවෙලින් රු.95,843,969 ක් හා රු.151,789,156 ක් විය.

(ආ) විශ්‍රාම වැටුප් දායක මුදල් වර්ෂ ගණනාවක සිට නොගෙවා තිබීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට රු.9,829,692 මුදලක් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල්ට ගෙවිය යුතුව තිබුණි.

(ඇ) විවිධ හේතු මත 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම්වල එකතුව රු.1,889,098 ක් වූ අතර, එයින් වසර 12 කටත් වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී තිබූ සේවකයින් 95 දෙනෙකුගෙන් අයවිය යුතු ණයවල වටිනාකම රු.176,928 ක් විය.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**-----------------------------------**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 217,285,661 ක් වූ ගිණුම් ශේෂ විගණනයේ දී සතුටුදායක ලෙස නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**-----------------------------------------------------**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි අංක 371 අනුව, 2001 සිට 2004 දක්වා සහ 2013 හා 2015 වර්ෂ තුලදී ලබාදී තිබූ එකතුව රු.1,099,407 ක් වටිනා තත්කාර්ය අතුරු අග්‍රිම 27 ක් පියවීමට සහ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පතු රු.6,736,170 ක් සම්බන්ධයෙන් නියමිත පරිදි කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,240,776 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.41,642,916 ක් විය.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**-------------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාළ විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයයන් | අයවැයගත | තථ්‍ය | විචලනය |
| --- | --- | --- | --- |
| | රු. '000 | රු. '000 | රු. '000 |
| <u>පුනරාවර්තන වියදම්</u> | | | |
| පුද්ගල පඩිනඩි | 48,650 | 85,047 | (36,397) |
| අනෙකුත් | 38,359 | 24,676 | 13,683 |
| උප එකතුව | 87,009 | 109,723 | (22,714) |
| ප්‍රාග්ධන වියදම් | 431,025 | 11,670 | 419,355 |
| මුළු එකතුව | 518,034 | 121,393 | 396,641 |

සමාලෝචිත වර්ෂය තුලදී ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම් වලින් රු.419,355 ක් හෙවත් සියයට 97 ක් වැයකර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නගර සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| --- | --- | --- | --- | --- |
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (අ) | වරිපනම් හා බදු | 16,734 | 16,983 | 76,359 |
| (ආ) | බදුකුලී | 32,657 | 26,301 | 1,089 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 912 | 742 | -- |
| (ඈ) | වෙනත් ආදායම් | 339,050 | 17,507 | 28,258 |

ආදායම් විෂයයන් 4 ක ඉකුත් වර්ෂය අවසානයට සමුච්චිත හිඟයේ හා සමාලෝචිත වර්ෂයේ ඇස්මේන්තුගත ආදායමේ එකතුව රු.469,952,882 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම රු.61,532,047 ක් වීම හේතුවෙන් ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය සියයට 13 ක් වැනි පහළ මට්ටමක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී සභාව විසින් හිඟ ආදායම් හා බිල්කල ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය පහත පරිදි විය.

| ආදායම් ශීර්ෂය | 2015.01.01 දිනට හිඟ ආදායම | හිඟයෙන් අයවීම | හිඟ අයවීමේ ප්‍රගතිය | වර්ෂය තුළ බිල්කල ආදායම | බිල්කල ආදායමින් අයවීම | අයවීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | % | රු. '000 | රු. '000 | % |
| වරිපනම් හා අක්කර බදු | 57,424 | 3,347 | 06 | 4,226 | 2,594 | 61 |
| කුලී | 20,820 | 1,870 | 09 | 39,692 | 12,589 | 32 |
| බලපත්‍ර ගාස්තු | -- | -- | -- | 1,662 | 537 | 32 |
| අනෙකුත් ආදායම් | -- | -- | -- | 11,650 | 16,870 | 145 |

**2.3.2** <u>වරිපනම් බදු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වරිපනම් බදු අයකිරීම නගර සභා ආඥා පනතේ 170 (1) හා (2) වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු මහ නගර සභා ආඥා පනතේ 252, 255 හා 256 වගන්ති අනුව සිදුකල යුතු වුවත්, නගර සභාවේ පරිගණක වැඩසටහන අනුව හිඟ වරිපනම් බදු අයකිරීමට විනිග්‍රහන බලපත්‍රයක් නිකුත් නොවන අවස්ථාවලදී ද සෑම ඒකකයක් සඳහාම අධිගාස්තු එකතු වීම ස්වයංක්‍රීයව සිදුවන බැවින්, කාර්තුවක් අවසානයේදී අධිගාස්තු එකතුවීම තුළ විශාල හිඟ මුදලක් පරිගණක පද්ධතිය තුළින් පෙන්නුම් කෙරේ.

(ආ) වරිපනම් බදු අයකිරීම නිදහස් කර නොතිබූ පුත්තලම නගරයේ මුස්ලිම් පල්ලි දෙකකට අයත් දේපල 122 කින් රු.3,858,138 ක හිඟ වරිපනම් බදු අයවීමට තිබුණි.

(ඇ) වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙන ආ හිඟ වරිපනම් බදු රු.57,424,471 ක් වූ අතර, බිල්කල මුදල රු.16,720,594 ක් විය. වර්ෂය තුළ අයකර ඇති ප්‍රමාණය රු. 11,026,981 ක් වීමෙන් රු.63,118,084 ක හිඟයක් අයවීමට තිබුණි. මෙය හිඟ මුදලින් සියයට 85% අගයක් ගෙන තිබුණි.

**2.3.3** <u>බදුකුලී</u>

පොදු වෙළඳපල මස් කඩ කාමර දෙකක හිඟ බදු රු.89,329 ක් ගෙවීම පැහැර හැර තිබුණද බදුකරුවන්ට එරෙහිව බදු ගිවිසුම ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.3.4** <u>මුද්දර ගාස්තු</u>

2015 ජනවාරි 01 දිනට හිඟ මුද්දර ගාස්තුවල එකතුව රු.4,047,325 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය තුළ ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.5,985,784 ක් ද සමඟ ලැබිය යුතු මුළු වටිනාකම රු.10,033,109 ක් විය. මෙයින් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.2,903,597 ක මුද්දර ගාස්තු ලැබී තිබූ අතර, වර්ෂය අවසානයට රු.7,129,512 ක් තවදුරටත් ලැබිය යුතුව තිබුණි.

**2.4 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

<u>අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව සේවකයින් 87 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබාදී තිබීමෙන් සේවකයින් 87 දෙදෙනෙකු අතිරික්ත වී තිබුණි. මෙම සේවක පිරිස ආයතනයෙහි රඳවාගෙන සිටීමෙන් ඔවුන්ගේ වැටුප් හා දීමනා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය නොවීම නිසා 2015 වර්ෂය තුළ රු.27,537,784 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ආ) සේවකයින් 87 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබාදීමෙන් පසුව ද අනියම් හා ආදේශක සේවකයින් 36 දෙනෙකු වෙනුවෙන් රු.8,498,223 ක වැටුප් ගෙවා තිබුණි.

(ඇ) අතිරික්ත සේවක පිරිස් දෛනිකව සේවයේ යෙදවීමේදී පූර්ව වැඩසටහන්/ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව අවිධිමත් ආකාරයට සෞඛ්‍ය හා මාර්ග අංශවල සේවයේ යොදවා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 කාර්ය සාධන ඇගයීම**

**-----------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය තුලදී නගර සභාව විසින් ඉටුකිරීමට යෝජිතව තිබූ එකතුව රු.13,800,000 ක් වූ කර්මාන්ත 06 ක් ඉටුකිරීමට අපොහොසත්ව තිබුණි.

(ආ) ඇස්තමේන්තුගත වියදම රු.416,100,000 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 12 ක් සඳහා තථ්‍ය වියදම රු.20,020,412 ක් වූ අතර ඒ සඳහා සභාව ප්‍රමාණවත් දායකත්වයක් දක්වා නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

පහත නිරීක්ෂණන් කරනු ලැබේ.

(අ) 2003 හා 2004 වර්ෂවල දී විවිධ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබූ ණය වෙනුවෙන් වාරික හා පොලී නිසි පරිදි ගෙවා නොතිබුණු අතර, මුළු හිඟ ණය වාරිකවල එකතුව රු.322,721 ක් වූ අතර, හිඟ හිටි ණය පොලී රු.399,161 ක් විය.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයේ ගිනි බටයින් 09 දෙනෙකු සේවය කලයුතු වුවද, ඒ වෙනුවට අනියම් කම්කරුවන් ඒ සඳහා සේවයට යොදවා ගෙන තිබුණි. එහෙත් ඔවුන්ගෙන් දෙදෙනෙකු විශ්‍රාම ගොස් තිබූ අතර, ඉතිරි 07 දෙනා 2015 දෙසැම්බර් 31 දිනට ද සේවයේ යොදවා තිබුණද, ගිනි නිවන රථය වර්ෂ ගණනාවක සිට තත්ත්වයෙන් අක්‍රියව පැවතීම හේතුවෙන් ඔවුන්ගේ සේවය ද යොදා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ (වයඹ) 2012 සැප්තැම්බර් 03 දිනැති අංක සං/16/විගණන හා කළමනා.ක දරන ලිපිය අනුව අභ්‍යන්තර විගණන නිලධාරියකු පත්කර සිටිය ද, ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුව නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාලව සභාව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවද, එසේ සිදුකර නොතිබුණි.

**3.3 හඳුනාගත් අලාභ**

-----------------

අංක NWPF- 7982 දරන වාහනයේ අනතුර සිදුවී වර්ෂයක් ඉක්මවා තිබුණද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වන්දි මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි. අනතුර නිසා වන්දි ගෙවීම ප්‍රතික්ෂේප වීම තුළ එය අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට නොහැකිවීමෙන් සභාවට රු.7,900,000 ක අලාභයක් සිදුව තිබුණි.

**3.4 සන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතියේ 2015 වර්ෂය තුළ රු.2,626,550 ක අලාභයක් පෙන්නුම් කරන අතර, එම ව්‍යාපෘතිය ලාභදායි ලෙස ක්‍රියාත්මක කිරීමට සභාවේ වගකිව යුත්තන් කටයුතු කර නොතිබුණි. අලෙවි ප්‍රවර්ධනය වෙනුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එමෙන්ම 2015 වර්ෂය තුළ කොම්පෝස්ට් ව්‍යාපෘතිය තුළින් ජනිත වූ මෙහෙයුම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-----------------------------------------

**4.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

එකතුව රු.4,234,130 ක් වූ වතුර මෝටරයක් සහ වාහන 05 ක් නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව තිබුණි.

**4.2 භාණ්ඩ සමීක්ෂණය**

---------------------

2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට බලධාරීන් කටයුතු කර නොතිබීම හේතුවෙන් වාර්ෂික සමීක්ෂණයක් පැවැත්වීමේ ප්‍රධාන අරමුණු ඉටු නොවී පවතින අතර, සෑම වර්ෂයක් තුළම නොවිසඳී පවත්නා ගැටළු වැඩිවීමක් දක්නට ලැබුණි.

**4.3 පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

-----------------------------------------------------------

නගර සභාව සතු ඉඩම්වල නිරවුල් භාවය තහවුරු කර ගැනීම සඳහා පැවරුම් නියෝග ලබාදෙන ලෙස පුත්තලම ප්‍රාදේශීය ලේකම් වෙතින් නගර සභාව අවස්ථා කිහිපයකදී ඉල්ලීම් කර තිබුණත්, එම කටයුතු ප්‍රමාදවීම තුළ නගර සංවර්ධන කටයුතු කඩිනමින් හා විධිමත්ව ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි.

5. **පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණනය

(ආ) ගිණුම්කරණය

(ඇ) ණයගැති හා ණයහිමි පාලනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) වත්කම් කළමනාකරණය